# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2297/59 – 2022 සැප්තැම්බර් මස 15 වැනි බ්‍රහස්පතින්දා – 2022.09.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2020/235.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශවයක් වශයෙන්,*

1. කේ. ඒ. එන්. ප්‍රේමසිරි මයා, ජී 55, ටොරින්ටන් මහල් නිවාස, ටොරින්ටන් මාවත, කොළඹ 05.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව, නිදහස් චතුරශ්‍රය, කොළඹ 07.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මහරගම, නාවින්න, ශ්‍රී දේවානන්ද පාර, අංක 33, නීතිඥ කුමාරසිංහ අමරනාත් පෙරේරා රාජකරුණා මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

මනූෂ නානායක්කාර,
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2022 සැප්තැම්බර් මස 05 වැනි දින,
කොළඹ දී ය.

1A – G 37491 – 14 (2022/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/03/2020/235.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්,*

1. කේ. ඒ. එන්. ප්‍රේමසිරි මයා, ජී 55, ටොරින්ටන් මහල් නිවාස, ටොරින්ටන් මාවත, කොළඹ 05.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව, නිදහස් චතුරස්‍රය, කොළඹ 07.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

''ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ අතිරේක අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කරමින් සිට 2018.06.20 දින විශ්‍රාම ගිය කේ. ඒ. එන්. ප්‍රේමසිරි මහතාට පහත සඳහන් කරුණු මගින් අසාධාරණයක් සිදුව තිබේද යන්නත්, එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහන කවරේද යන්නත් පිළිබඳව වේ.,

1. ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ අධ්‍යක්ෂවරුන් MM 1-1 වැටුප් පියවරේ සිට HM වැටුප් පියවරේ පිහිටුවන ලද 2018.05.14 දින සිට කේ. ඒ. එන්. ප්‍රේමසිරි මහතා විශ්‍රාම ගිය 2018.06.20 දින දක්වා කාලය සඳහා හිඟ වැටුප් හා දීමනා හිමි ද යන්නත් හිමිනම් එය ලබා නොදීම.
2. වෘත්තීය දීමනා හිඟ මුදලක් තිබේද යන්නත් තිබේ නම් එය ලබා නොදීම.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 අගෝස්තු මස 31 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 09-0158

---

මගේ අංකය: IR/COM/01/2021/97.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2022.08.08 වන දින අංක 2292/06 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2022.07.28 වැනි දින දරන නියෝගයෙන්,

ඩී. ඒ. අනිල් නිශාන්ත මයා ඇතුළු සේවකයින් 14 දෙනා, සීමාසහිත ස්වාධීන රූපවාහිනී සේවය, වික්‍රමසිංහපුර, බත්තරමුල්ල.

සහ

සීමාසහිත ස්වාධීන රූපවාහිනී සේවය, වික්‍රමසිංහපුර, බත්තරමුල්ල.

අතර පවත්නා 2022.07.28 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් නීතිඥ එල්. ඒ. එම්. නිමල් අබේසිංහ මහතා වෙත යොමු කරන ලදී.

බේරුම්කරු නීතිඥ එල්. ඒ. එම්. නිමල් අබේසිංහ මයා ධුරයෙන් ඉල්ලා අස්වන බව දන්වා ඇත. එබැවින් යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දූන් පෙනී යන හෙයින් කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මා එම නියෝගය අවලංගු කරන අතර එකී 2022.07.28 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙසද මෙයින් නියෝග කරමි.

මනූෂ නානායක්කාර,
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2022 සැප්තැම්බර් මස 05 වැනි දින,
කොළඹ දී ය.

EOG 09-0159/1

---

මගේ අංකය: IR/COM/01/2021/97.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

ඩී. ඒ. අනිල් නිශාන්ත මයා ඇතුළු සේවකයින් 14 දෙනා, සීමාසහිත ස්වාධීන රූපවාහිනී සේවය, වික්‍රමසිංහපුර, බත්තරමුල්ල.

සහ

සීමාසහිත ස්වාධීන රූපවාහිනී සේවය, වික්‍රමසිංහපුර, බත්තරමුල්ල.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බත්තරමුල්ල, කොස්වත්ත, රිචඩ් ද සොයිසා නිවාස සංකීර්ණය, අංක. 4, නීතිඥ පියල් දර්ශන ගුරුගේ මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

මනූෂ නානායක්කාර,
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2022 සැප්තැම්බර් මස 05 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/01/2021/97.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ඩී. ඒ. අනිල් නිශාන්ත මයා ඇතුළු සේවකයින් 14 දෙනා, සීමාසහිත ස්වාධීන රූපවාහිනී සේවය, වික්‍රමසිංහපුර, බත්තරමුල්ල.

සහ

සීමාසහිත ස්වාධීන රූපවාහිනී සේවය, වික්‍රමසිංහපුර, බත්තරමුල්ල.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

''සීමාසහිත ස්වාධීන රූපවාහිනි සේවයේ සේවකයින් වන ඩී. ඒ. අනිල් නිශාන්ත මයා ඇතුළු පහත නම් සඳහන් සේවකයින් 14 දෙනා විසින් ඉල්ලා ඇති,

1. නිසි පරිදි MSD 25 චක්‍රලේඛයට අනුව, එම ශ්‍රේණිවල පිහිටුවීම.
2. නිසි ක්‍රමවේදයකට අනුව, 30/2006 චක්‍රලේඛයේ (MM 1-1) වැටුප් පියවරෙහි පිහිටුවීම.
3. ඊට සමගාමීව හිඟ වැටුප් සහ වරප්‍රසාද ලබා දීමට කටයුතු කිරීම.

යන ඉල්ලීම් ලබා ගැනීමට හිමිකමක් හිමි ද යන්නත් එසේ හිමිකමක් තිබේ නම් සිදු වී ඇති අසාධාරණය සම්බන්ධයෙන් ඔවුන්ට හිමිවිය යුතු සහනයන් කවරේද  යන්නත් වේ.''

1. ඩී. ඒ. අනිල් නිශාන්ත මයා
2. පී. බන්දුල ශ්‍රී පද්මලාල් ද සිල්වා මයා
3. අයි. ශ්‍යාමා ප්‍රියදර්ශනී ජයසිංහ මෙය
4. එම්. තයාපරන් මයා
5. කේ. අමරදාස මයා
6. කේ. ඩබ්. කිත්සිරි කුමාර මයා
7. කේ. බී. වී. එස්. කල්‍යානප්‍රිය මයා
8. එම්. ජී. සරත් මයා
9. එම්. අයි. රූපසිංහ මිය
10. ඩී. ඩී. නිශාන්ත මයා
11. වී. මේනුකා ශ්‍රියානි අල්විස් මිය
12. තමරි මහවිතාන මිය
13. ඒ. පී. හෙට්ටිආරච්චි මිය
14. ඩී. ජී. නයනා වික්‍රමසුන්දර මෙය

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 සැප්තැම්බර් මස 01 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 09-0159/ 2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.